# එකතු කළ අගය මත බදු (VAT) සහ රඳවා ගත් බදු (WHT) සඳහා ගිණුම්කරණය

# එකතු කළ අගය මත බදු (VAT) සඳහා ගිණුම්කරණය

එකතු කළ අගය මත බදු සඳහා වන සීමාවට වඩා ආදායම ඉහළ නම් රජය මගින් දෙන නිශ්චිත අනුපාතයක් යටතේ තම ආදායම් මත VAT ගෙවීමට ආයතන වලට සිදුවේ. ආයතන විසින් භාණ්ඩ හා සේවා අලෙවි කිරීමේදී ඉන්වොයිසියේ ඇති විකුණුම් මිලට VAT අගය එකතු කොට ගනුදෙනුකරුවන්ට එම බද්ද පැවරීම සාමාන්‍යයෙන් සිදුවේ. එලෙස එකතු කරගන්නා මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට ආයතනය කටයුතු කළ යුතුවේ. ඒ අනුව ගනුදෙනුකරුවන්ගෙන් එකතු කරගන්නා VAT බදු හෙවත් **නිමැවුම් මත VAT** ව්‍යාපාරයේ වගකීමක් වේ.

අනෙක් අතට ආයතන වලට තම ගැනුම් මත VAT ගෙවීමට සිදුවේ. මෙය **යෙදවුම් මත VAT** බද්ද ලෙස හඳුනාගත හැකිය. ආයතන විසින් එලෙස සිය ගැනුම් මත ගෙවනු ලබන VAT රජයෙන් නැවත අය කර ගත හැකිය. කෙසේ නමුත් ප්‍රායෝගිකව සිදුවනුයේ ආයතනයක් ගනුදෙනුකරුවන්ගෙන් එකතුකර කරගන්නා VAT (නිමැවුම් මත VAT) මුදලෙන්, තම ගැනුම් මත ගෙවූ VAT (යෙදවුම් මත VAT) බදු අඩුකර ඉතිරිවන ශේෂය දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමයි. මේ අනුව මතක තබා ගත යුතු වැදගත් කරුණ වනුයේ VAT යනු ආයතනයකට ආදායමක් හෝ වියදමක් නොවන බවයි.

2020 ජනවාරි 01වන දා සිට VAT සඳහා අනිවාර්යෙන්ම ලියාපදිංචි විය යුතු පාර්ශවයන් පහත පරිදි වෙයි.

1) කුමන හෝ කාර්තුවක භාණ්ඩ හා සේවා සැපයුම රුපියල් මිලියන 75 ඉක්මවයි නම් හෝ ඉක්මවයි කියා පෙනී යන්නේ නම් හෝ නැතහොත්

කුමන හෝ වර්ෂයක භාණ්ඩ හෝ සේවා සැපයුම රුපියල් මිලියන 300 ඉක්මවයි නම් හෝ ඉක්මවා යයි කියා පෙනී යන්නේ නම් එවැනි පාර්ශවයන්

2) තොග හෝ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරවල නිරතව සිටින තනි පුද්ගල හා හවුල් ව්‍යාපාර ආයතනයන් වල කාර්තුවක මුළු පිරිවැටුම රුපියල් මිලියන 75 ඉක්මවයි නම් එම ආයතනයන්ද VAT ලියාපදිංචි විය යුතුයි.

විවිධ භාණ්ඩ හා ක්‍රියාකාරකම් සඳහා අදාල වන VAT අනුපාතයන් වෙනස් වන අතර මෙම VAT අනුපාතයන් කාලානුරූපීව පවත්නා නීති රීති අනුව සංශෝධනයට ලක්විය හැක.

### VAT නිදහස් භාණ්ඩ

ඇතැම් ආනයනික භාණ්ඩ වර්ග ආනයනය කිරීමේදී මෙන්ම මෙවැනි භාණ්ඩ දේශිය වශයෙන් විකිණීමේදී ද VAT අය නොකරන අතර මේවා හඳුන්වන්නේ VAT නිදහස් භාණ්ඩ ලෙසිනි.

*උදා- කෘෂිකර්මාන්තයේදී භාවිතා කරන රට පොහොර වර්ගයන් බෙහෙත් ආදිය*

තවද අලෙවියේ දී පමණක් VAT නිදහස් භාණ්ඩ වර්ගයන් ද දැකිය හැක

*උදා- තීරු බදු නිදහස් භාණ්ඩ අලෙවිය*

### VAT 0% වන භාණ්ඩ (Zero rated VAT)

මෙම භාණ්ඩ VAT වලට යටත් වුවත් එය ගණනය වන්නේ 0% අනුපාතයකටය. ඕනෑම අපනයන භාණ්ඩයක් සඳහා VAT 0% වේ. එනම් මෙවැනි භාණ්ඩ මත VAT අගයක් ගෙවිය යුතු නොවන නමුත් එවැනි භාණ්ඩ නිෂ්පාදනයේ දී යෙදවුම් මත දරන ලද VAT වියදමක් වේ නම් ඒවා යළි අයකර ගත හැක. නැතහොත් හිමිකම් පෑමක් කළ හැක. එවැනි භාණ්ඩ සඳහා මෙම 0% අනුපාතය අදාළ වේ.

**අභ්‍යාසය 01**

සීමිත රණබාහු සමාගමේ දේශීය වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරන සමාගමකි. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා පහත තොරතුරු ඔබට සපයා ඇත. සියලු මිල ගණන් VAT ඇතුළත්ව දක්වා ඇත.

| | රු. '000 |
|---|---|
| VAT ලියාපදිංචි ආයතන සඳහා කළ විකුණුම් ........................................ | 5,750 |
| VAT ලියාපදිංචි නොවූ ආයතන සඳහා කළ විකුණුම් ........................... | 1,725 |
| ගෙවූ වැටුප් හා වේතන ............................................................................... | 1,500 |
| දුරකථන වියදම් (VAT ඇතුළත්ව) ............................................................. | 138 |
| කම්හල සඳහා මිලදී ගත් යන්ත්‍රය (VAT ඇතුළත්ව) .............................. | 920 |
| අමුද්‍රව්‍ය මිලදී ගැනීම් (VAT ඇතුළත්ව) .................................................... | 4,140 |

VAT අනුපාතය 15%ක් බව සලකන්න.

2020 දෙසැම්බර් 31න් අවසන් කාර්තුව සඳහා සමාගම විසින් ගෙවිය යුතු VAT බද්ද දක්වන ප්‍රකාශනයක් පිළියෙළ කරන්න.

**අභ්‍යාසය 02**

සීමිත සුමනසිරි සමාගම දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කොට අලෙවි කරනු ලබයි. 2021 මාර්තු 31න් අවසන් කාර්තුව සඳහා සමාගමට අදාලව පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | රු '000 |
|---|---|
| අපනයන ආදායම (VAT ඇතුළත්ව) .................................................. | 9,200 |
| දේශීය විකුණුම් (VAT ඇතුළත්ව) ........................................................ | 5,750 |
| මුළු විකුණුම් ආදායම ................................................................................ | 14,950 |
| අපනයන භාණ්ඩ සඳහා VAT ඇතුළත් නිෂ්පාදන වියදම .............. | 3,450 |
| දේශීය විකුණුම් සඳහා VAT ඇතුළත් නිෂ්පාදන වියදම .................. | 3,450 |
| විදුලි වියදම් (VAT ඇතුළත්ව) .............................................................. | 115 |
| අනිකුත් වියදම් (VAT ඇතුළත්ව) ........................................................ | 230 |

අදාල තැන්හි VAT අනුපාතය 15%ක් බව උපකල්පනය කරන්න.

සමාගම විසින් 2021 මාර්තු 31න් අවසන් කාර්තුව සඳහා ගෙවිය යුතු වැට් බද්ද දක්වන ප්‍රකාශනයක් පිළියෙළ කරන්න.

**VAT සඳහා ගිණුම්කරණය**

VAT සඳහා ගිණුම්කරණයේ දී මතක තබා ගත යුතු කරුණු කිහිපයක් ඇත.

- VAT සඳහා ගිණුම් තැබීම උපචිත පදනම මත සිදුවේ.
- VAT බදුකරණයේදී ව්‍යාපාර ආයතනය රජයේ නියෝජිත ආයතනයක් ලෙස කටයුතු කටයුතු කරයි. එබැවින් VAT සහිත විකුණුම් ආයතනයෙන් මුළු විකුණුම් නොවන අතර VAT රහිත විකුණුම් පමණක් ආයතනයේ විකුණුම් ලෙස සැලකිය යුතුයි. එමෙන්ම VAT සහිත මුළු වියදම් ආයතනයේ වියදම් නොවන අතර එය රජය වෙනුවෙන් කළ තාවකාලික ගෙවීමක් බැවින් එය මුළු VAT වගකීමෙන් අඩු / හිලව් කළ හැක.
- VAT ගිණුම්ගත කිරීම සඳහා ගිණුම් දෙකක් භාවිතා කෙරේ. එනම්, නිමැවුම් මත VAT සඳහා ගෙවිය යුතු වැටි ගිණුමකුත්, යෙදවුම් මත VAT සඳහා ලැබිය යුතු VAT ගිණුමකුත් යනුවෙනි. කෙසේ නමුත් ඉහත ගෙවිය යුතු VAT සහ ලැබිය යුතු VAT සඳහා තනි ගිණුමක් පවත්වා ගැනීමද සිදුකල හැක. එලෙස තනි ගිණුමක් පවත්වා ගනු ලබන්නේ නම්, එය VAT පාලන ගිණුම ලෙස හැඳින්වේ.

VAT පාලන ගිණුමක ආකෘතිය පහත පරිදි වේ.

**VAT පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | xxx | ශේෂය ඉ/ගෙ | xxx |
| ගැනුම් මත ගෙවූ VAT අගය | xxx | විකුණුම් මත ගෙවිය යුතු VAT අගය | xxx |
| අනෙකුත් සේවා ලබා ගැනීමේදී ගෙවු VAT | xxx | සේවා සැපයුම් මත ගෙවිය යුතු VAT අගය | xxx |
| ආපසු එවුම් මත වන VAT අගය | xxx | ආපසු යැවුම් මත වන VAT අගය | xxx |
| මුදල් (කාලච්ඡේදය තුළ රජයට ගෙවූ/පියවූ ) | xxx | | |
| ශේෂය ප/ගෙ | xxx | ශේෂය ප/ගෙ | xxx |
| | xxxx | | xxxx |

**අභ්‍යාසය 03**

ඉහත අභ්‍යාස 01 හි සඳහන් තොරතුරුවලට අමතරව පහත තොරතුරු ද සමාගමේ ගණකාධිකාරිවරයා විසින් ඔබට සපයා ඇත.

| | රු '000 |
|---|---|
| 2020/10/01 දිනට ගෙවිය යුතු VAT................................................................................ | 150 |
| කාර්තුව තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ මුදල් ......... | 200 |

අවශ්‍ය වන්නේ,

2020 දෙසැම්බර් 31න් අවසන් කාර්තුව සඳහා සීමිත රණබාහු සමාගමේ VAT පාලන ගිණුම පිළියෙල කරන්න

අභ්‍යාසය 04

සීමාසහිත ඉන්සයිට් (පෞද්ගලික) සමාගම, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ සමාගමකි. 2019 මාර්තු මාසයට අදාලව සීමාසහිතව ඉන්සයිට් (පෞද්ගලික) සමාගමේ පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

| | |
|---|---|
| විකුණුම් (එකතුකළ අගය මත බදු රහිතව) | 367,000 |
| ණයට ගැනුම් (එකතුකළ අගය මත බදු රහිතව) | 196,000 |
| අත්පිට මුදලට ගැනුම් (එකතුකළ අගය මත බදු සහිතව) | 3,450 |
| 2019 මාර්තු 01 දිනට එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ බැර ශේෂය | 1,220 |

අදාළ වන එකතු කළ අගය මත බදු අනුපාතය 15% කි.
2019 මාර්තු 31 දිනට ගෙවිය යුතු එකතුකළ අගය මත බදු ශේෂය ගණනය කරන්න.

අභ්‍යාසය 05

**සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** 2020 මාර්තු 31 දිනෙන් අවසන් මාසයට අදාල වාර්තාවලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන තිබේ:

| | **රු.'000** |
|---|---|
| විකුණුම් මත අය කළ එකතු කළ අගය මත බදු (VAT) | 9,000 |
| මිලට ගැනුම් මත එකතු කළ අගය මත බදු | 5,500 |
| විකුණුම් ආපසු එවුම් මත එකතු කළ අගය මත බදු | 550 |

2020 මාර්තු 01 දිනට එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ බැර ශේෂය රු.4,500,000/- කි.

එකතු කළ අගය මත බදු පාලන ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 03)

**(AAT - AFC - January 2021)**

අභ්‍යාසය 06

සීමාසහිත පෙරේරා (පෞද්ගලික) සමාගම, එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT) සඳහා ලියාපදිංචි සමාගමකි. 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා පහත සඳහන් තොරතුරු සමාගමේ පොත්වලින් උපුටාගෙන ඇත.

| | රු. |
|---|---|
| විකුණුම් (එකතු කළ අගය මත බදු රහිතව) | 4,939,940 |
| බදු ඉන්වොයිසි මගින් සනාථ කළ ගැනුම් (එකතු කළ අගය මත බදු රහිතව) | 1,777,900 |
| 2017 ජනවාරි 01 දිනට එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ (VAT) බැර ශේෂය | 22,500 |

අදාල VAT අනුපාතය 15% කි.
2017 මාර්තු 31 දිනට එකතු කළ අගය මත බදු (VAT) පාලන ගිණුමේ බැර ශේෂය

**(AAT January 2018)**

**අභ්‍යාසය 07**

එකතු කළ අගය මත බදු (Value Added Tax -VAT) සඳහා ලියාපදිංචි සැපයුම්කරුවෙකු වන සීමාසහිත ඩෝ ටූ ඩෝ (පෞද්ගලික) සමාගම, දේශීයව පණිවුඩ සේවා (local courier service) සපයන්නෙකු වන අතර පහත තොරතුරු 2015 සැප්තැම්බර් මාසය සඳහා එහි පොත්වලින් උපුටා ගන්නා ලදී.

| විස්තරය | රු. |
|---|---|
| එකතු කළ අගය මත බදු (VAT) වලට යටත් පණිවුඩ සේවා සැපයුම් | 18,463,000 |
| වලංගු එකතු කළ අගය මත බදු ඉන්වොයිසි මගින් සනාථ කළහැකි මිලදී ගැනුම් | 6,382,000 |
| එකතු කළ අගය මත බදු (VAT) ඉන්වොයිසි මගින් සනාථ කළ හැකි එකතුකළ අගය මත බදු (VAT) වලට යටත් අනෙකුත් වියදම් | 1,312,000 |

එකතුකළ අගය මත බදු (VAT) අනුපාතිකය 12% ක් යැයි උපකල්පනය කරන්න.
2015 සැප්තැම්බර් 30 දිනට එකතුකළ අගය මත බදු (VAT) පාලන ගිණුම පිළියෙල කරන්න.

(ලකුණු 03)
**(AAT - AA2 - January 2016)**

## රඳවා ගැනීමේ බද්ද (Withholding tax)

බදු අය කළ හැකි නැතහොත් බද්දට යටත් වන යම් ගනුදෙනුවක් හෝ සේවාවක් යම් පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් ලබාගත් පසු ඒ සඳහා ගෙවිය යුතු මුළු මුදලම අදාළ ගනුදෙනුව හෝ සේවාව සැපයු සැපයුම්කරුට නොගෙවා දී ඇති යම් ප්‍රතිශතයක් මත බදු මුදලක් ලෙස රඳවා ගන්නා ප්‍රමාණය රඳවා තබා ගැනීමේ බද්ද ලෙස හැඳින්වේ.

මෙලෙස රඳවා ගන්නා මුදල්, අදාල සේවාව ලබාගත් ගැනුම්කරු විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අදාළ තොරතුරු ද සමග ලබා දිය යුතු වේ. එමෙන්ම අදාළ ගනුදෙනුව හෝ සේවාව සැපයූ සැපයුම්කරුට, ගැනුම්කරු විසින් රඳවා තබා ගැනීමේ බද්දට සමාන ප්‍රමාණයක් සඳහා රඳවා තබා ගැනීමේ බදු සහතිකයක් නිකුත් කරනු ලැබේ. මෙම සහතිකය සැපයුම්කරුට තමාගේ අවසාන බදු ගණනට කිරීම් වලදී බදු බරක් (tax credit) ලෙස භාවිතා කළ හැක.

**රඳවා තබා ගැනීමේ බද්දට යටත් වන දෑ**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ රඳවා තබා ගැනීමේ බද්දට යටත් වන ගනුදෙනු හා සේවාවන් දක්වා ඇත. ඒවා අතුරින් කිහිපයක් පහත දැක්වේ.

(i) ගෙවීම් කරන තැනැත්තාගේ සේවා නියුක්තියෙකු නොවන වාසික පුද්ගලයකු වෙත,

- ඉගැන්වීම්, දේශන පැවැත්වීම, විභාගයක් පරීක්ෂා කිරීම, නිරීක්ෂණය කිරීම හෝ අධීක්ෂණය කිරීම වෙනුවෙන් යම් ගාස්තුවක් ගෙවීමේදී,
- වාසික රක්ෂණ, අලෙවි හෝ තැරැව් නියෝජිතයකු සඳහා කොමිස් මුදලක් හෝ බ්‍රෝකර් ගාස්තුවක් ලෙස යම් ගාස්තුවක් ගෙවීමේදී,
- සහතික කිරීමේ ගාස්තුවක් ලෙස යම් ගාස්තුවක් ගෙවීමේදී
- ටෙන්ඩර් හෝ මිල නියම කිරීම මගින් කොන්ත්‍රාත් පදනමින් යම් භාණ්ඩයක් සැපයීමට අදාළව හෝ

- නියෝග මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කරුණු සඳහා ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත සේවා ගාස්තුවක් ගෙවන අවස්ථාවකදී හෝ

(ii) නිර්වාසික තැන්තෙකු වෙත ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත සේවා ගාස්තුවක් හෝ රක්ෂණ වාරික මුදලක් ගෙවන අවස්ථාවකදී,

රඳවා තබා ගැනීමේ බදු අඩු කරනු ලැබේ.

**රඳවා තබා ගැනීමේ බදු සඳහා ගිණුම් තැබීම**

රඳවා තබා ගැනීමේ බදු ගිණුම් තැබීමේ දී මතක තබා ගත යුතු කරුණු කිහිපයක් ඇත.

- රඳවා තබා ගැනීමේ බද්දට අදාළව ගිණුම් තැබීම ගනුදෙනුවට සම්බන්ධ වන දෙපාර්ශවයම හරහා සිදු වේ. එනම් සේවා ගැනුම් ගැනුම්කරු සහ සේවා විකුණුම්කරු යන දෙපාර්ශවයම රඳවා ගැනීමේ බද්ද ගිණුම් ගත කෙරේ.

- VAT බදු වලදී මෙන් නොව, ගැනුම්කරු විසින් රඳවා ගත් බද්ද ද ඇතුළත් සමස්ත වියදම ආදායම් ප්‍රකාශනය තුළ වියදම් ලෙස සටහන් කෙරේ. අනෙක් අතට, සේවා සපයන සැපයුම්කරුගේ ආදායම වනුයේ රඳවාගත් බද්ද ද ඇතුළත් මුළු ආදායමයි.

**ගැනුම්කරුගේ ගිණුම් පොත්වල රඳවාගත් බද්ද සඳහා ගිණුම්කරණය**

මීට අදාළ ද්විත්ව සටහන් පහත පරිදි වේ.

1. අදාල සේවා වියදම සටහන් කිරීම

| | |
|---|---|
| අදාල සේවා වියදම් ගිණුම් | හර |
| ගෙවිය යුතු සේවා වියදම් ගිණුම් | බැර |

2. වියදමට අදාල රඳවා තබා ගැනීමේ බද්ද සටහන් කිරීම

| | |
|---|---|
| ගෙවිය යුතු සේවා වියදම් ගිණුම | හර |
| ගෙවිය යුතු රඳවාගැනීමේ බදු ගිණුම | බැර |

3. වියදම මුදලින් ගෙවීම

| | |
|---|---|
| ගෙවිය යුතු සේවා වියදම් | හර |
| මුදල් ගිණුම | බැර |

4. කාලපරිච්ඡේදය අවසානයේ රඳවා තබා ගැනීමේ බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීම

| | |
|---|---|
| ගෙවිය යුතු රඳවා ගැනීමේ බද්ද | හර |
| මුදල් ගිණුම් | බැර |

**අභ්‍යාසය 08**

සීමිත සුරනිමල සමාගම සිය ප්‍රදර්ශනාගාරය පවත්වා පවත්වාගෙන යාම සඳහා සීමිත රණමයුර සමාගමෙන් මාසික කුලිය රුපියල් 100,000 කට ගොඩනැගිල්ලක් කුලියට ලබාගත් අතර 2020 දෙසැම්බර් 31න් අවසන් මාස තුන සඳහා වන කුලිය ගෙවන අවස්ථාවේදී 10%ක රඳවා තබා ගැනීමේ බද්ද අඩුකොට ඉතිරි මුදල 2021 ජනවාරි 03 දින රණමයුර සමාගම වෙත ගෙවන ලදී. තවද අඩු කරන ලද රඳවා තබා ගැනීමේ බද්ද 2021 ජනවාරි 15 වන දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරන ලදී.

අවශ්‍ය ජර්නල් සටහන් හා ගිණුම් පිළියෙල කරන්න.

**සැපයුම්කරුගේ ගිණුම් පොත්වල රඳවාගත් බද්ද සඳහා ගිණුම්කරණය**

මීට අදාළ ද්විත්ව සටහන් පහත් පරිදි වේ.

1. ලැබිය යුතු ආදායම සටහන් කිරීම

| | | |
|---|---|---|
| ලැබිය යුතු ආදායම් ගිණුම | හර | |
| අදාල ආදායම් ගිණුම | | බැර |

2. රඳවා ගත් බද්ද සටහන් කිරීම (ගැනුම්කරු දැනටමත් අඩුකොට ඇති)

| | | |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තු ගිණුම | හර | |
| ලැබිය යුතු ආදායම් ගිණුම | | බැර |

3. ආදායම හා රඳවාගත් බදු සහතිකය ලැබෙන විට

| | | |
|---|---|---|
| මුදල් ගිණුම | හර | |
| ලැබිය යුතු ආදායම් ගිණුම | | බැර |

**අභ්‍යාසය 09**

ඉහත අභ්‍යාස 08 හි සඳහන් ගනුදෙනුවට අදාළව සීමාසහිත රණමයුර සමාගමේ ගිණුම් පොත්වලට ඇතුළත් කරන ජ'නල් සටහන් සහ ලෙජර ගිණුම් පිළියෙළ කරන්න.